# සන්නස

**Sannasa**
244 Princes Hwy
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
**www.sannasa.com**
email :sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241**after 4pm**

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සංස්කරණ උපදේශක / Editorial Advisor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රචා / Graphics**
ශානලී එදිරිසිංහ Shanalee Edirisinghe

**වෙළඳ දැන්වීම් / Advertising**
**S Jayasinghe**
03 8707 4604
0402 025 516
email- sjturaus@optusnet.com.au

**Kuma Gamage**
0414 215 280
email- ads.sannasa@gmail.com

**Account Details for Payments**

| | |
|---|---|
| **Account Name** | **- Sannasa Media** |
| Bank | - Westpac |
| BSB Number | - 033 341 |
| Account Number | - 590847 |

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වී ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ
මහින්ද දිසානායක දිවුල්ගනේ

**ඡේයා රූ / Photography**
Prasanna Kurukularatna

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku

**QLD**
Ananada Samaratunga
2, Santorini Pl.
Forest Lake
QLD 4078
(07) 3372 7958

**WA**
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhdist Vihara

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**SA**
Chandra Eeriyagama
08 8331 2318


පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත




## ලියා දන්වන වගයි

### නිදහස් සිතුවිලි

මේ පෙබරවාරියයි. මේ මාසයේ හතරවන දා ශ්‍රී ලංකාවේ නිදහස් දිනය යනුවෙන් නම් කර ඇත. පුරුද්දට චාරිත්‍රයක් මෙන් සැමරුවද දුරට කල්පනා කරන විට අපට ලැබී ඇත්තේ සැබෑ නිදහසක් ද නැත්නම් නිදහස සැමරීමේ නිදහස ද යන්න ගැටලුවකි.

ලෝකයේ අනෙක් රටවල් හා අධිරාජ්‍යවාදීන්ගෙන් හෝ වහල් බැමි වලින් රාජාණ්ඩුවලින් නිදහස ලබා ගත් රටවල් හා සසඳා බැලූ විට අප බැඳී තිබූ බැමි වලින් නිදහස බලා තිබේද? එසේ නම් අපි ආර්ථික සමාජයීය හා සංස්කෘතික වශයෙන් ඉදිරියට ගොස් තිබෙන්නෙමුද? නැත්නම් අප ගමන් කර ඇත්තේ ආපසස-ටද?

වැඩි දුරක් යා යුතු නැත. අපේ අසල්වැසි ඉන්දියාව දෙස බලන්න. ඉන්දියාව සිය විදේශ ණය සියල්ලම පාහේ මේ වන විට ගෙවා අවසන් කරමින් සිටිද්දී අපි තව තවත් ණය ගැතියන් බවට පත් වෙමින් සිටින්නෙමු.

අප මෙන් නොව මහා අරගලයකින් පසු නිදහස ලබා ගත් ඉන්දියාව අද ඉන්නා තැනත් අප ඉන්නා තැනත් සසඳා බලන්න. ඉන්දියාව නිදහස රාජාලියකු මෙන් පියඹා යද්දී අප කොකුන් දෙදෙනකු විසින් ඔසවාගෙන යන් ඉබ්බකු ලෙස හැඳින්වුවහොත් එය ඇත්තක් වන්නේ ඇයි. හේතු කීපයක් තිබේ.

පළමු කොටම අපට නිදස ලැබුණේ සැබෑ අරගලයක ප්‍රතිඵලයක් ලෙස නොවීම හරහා ස්වඅභිමානය යන සංකල්පය අපේ ජනතාව තුළ ඇති නොවීම ගත හැකිය. (අප බොහෝ දෙනෙක් පුරුදු වී සිටින්නේ අපේ රටේ නිදහස වෙනුවෙන් පෙනී සිටියේ සේනානායක බණ්ඩාරණායක පොනම්බලම් ගුණසිංහලා පමණක් කියාය. නිදහස ලැබීමට පෙර 30 - 40 දශකයේ ලංකාවේ වාමාශික ව්‍යාපාරය හරහා බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයට විරුද්ධව කම්කරු සටන් ජන අරගල කළ බලපෑම අපට නිදහස ලැබීමට ප්‍රධාන හේතුකාරකයක් වූ බව කිසි තැනක සඳහන් වන්නේ නැත)

බොහෝ රට වල ශ්‍රේෂ්ඨ දූරදර්ශී නායකයන් බිහි වූයේ අරගල කැපකිරීම් හා ලැබූ පන්නරයෙනි. ඒ ලැබූ පන්නරය හා දැනුම තම රටවල් දියුණු කිරීම උදෙසා කැප කිරීම ඒ රටවල් වල දියුණුවේ අඩිතාලම විය. අප රටේ නිදහස ලැබූ දා පටන් නායකයන්ගේ දූරදර්ශීභාවය ගැන කතා කිරීම පවා තේරුමක් නැත්තේ ඔවුන්ගේ ක්‍රියා කලාප වල ප්‍රතිඵල ඇස් පනාපිටම දැක ගත හැකි බැවිනි.

අප තේරුම් ගත යුතු කාරණය වන්නේ සැබෑම නිදහසක් යනු රටක නිවහල් ආර්ථික නිදහස යන්න බවයි. මොනම නිදහසක් තිබුණත් පලක් නොවන්නේ ආර්ථිකය හරහා අප බලවත් ජාතීන් හා බැඳී ඇති බැවිනි.

එනිසා අප රටක් වශයෙන් බොහෝ වැර වෑයම් කර උත්සාහ ගත යුත්තේ මේ ආර්ථික විලංගුවෙන් නිදහස් වන්නටය. නිදහස් උත්සව වල සැබෑ තේමාව විය යුත්තේ රටක දියුණුවට අවශ්‍ය වැඩ පිළිවෙල සකසා ගැනීම සඳහා අඩිතාලමක් දමා ගැනීමය. නිවැරදි පුද්ගලයන් තෝරා ගැනීමට උත්සාහ කිරීමය. අංග සම්පූර්ණ වැඩ පිළිවෙලක් නිර්මාණය කර ගැනීමටය. ඒ හරහා සැබෑ නිදහසක් ලබා ගැනීමටය.

එය කෙටි කලකින් කළ නොහැකි බව සැබෑය. අප උත්හාස කළ යුත්තේ අමාරු හා යථාර්ථවාදී තිරසාර වැඩ පිළිවෙලකට යොමු වීමටය.

සෑම වසරකටම වරක් කාලය හා මුදල්ද වැය කරමින් සිදුකරන සංස-කෘතික උත්සවයට පමණක් සීමා වී ඇති මේ නිදහස සැමරීමේ රටාව වහ වහා වෙනස් කළ යුතු කාලය දැන් එළැඹී තිබේ. නව නායකයකු නව පාලකයකු නව නීති රීති ගොඩ නැගී ඇති මොහොතක රජයේත් ජනතාවගේත් මූලික පරමාර්ථය විය යුත්තේ එයයි.

### තර්ජන වලින් සන්නස සෙළවෙන්නේ නැත

රාජපක්ෂ රජය යටතේ සන්නසට එල්ල වූ තර්ජන පිළිබඳ ප්‍රවෘත්තිය මේ වන විට අන්තර්ජාලය පරිහරණය කරන සියල්ලන්ම පාහේ දන්නා කතාවකි. මේ අභියෝගයේදී ඒ පිළිබඳ විමසමින් හා අප දිරි ගන්වමින් දුරකතන පණිවුඩ හා ඊමේල් එවූ ඕස්ට්‍රේලියාවේ හා ලොව පුරා විසිරි අපේ සියලුම පාඨකයනට අපේ කෘතවේදීත්වය මෙසේ පිරිනමන්නෙමු.

සන්නස හුදෙක් මුදල් ඉපැයීමේ පරමාර්ථයෙන් පවත්වාගෙන යන ව්‍යාපෘතියක් නොවේ. අප යන්නේ අරමුණක් ඇති ගමනකය. කුමන ආකාරයට තර්ජන ගර්ජන ආවද ඒ සියල්ලටම මුහුණ දෙමින් ඉදිරියටම යන්නට හොඳ පන්නරයක් හා ශක්තියක් ඇති පිරිසක් අප සමග එක්ව සිටිති. එනිසාම අප කිසි විටෙක අප කෙරෙහි විශ්-වාසය තැබූ අපේ පාඨකයන් අතහැර නොයන බව මේ අවස්ථාවේදී ද සඑථ කරන්නෙමු. ඔබ අප සමග සිටීම අපට විශාල ශක්තියකි.

අප පෙනී සිටින්නේ පීඩිතයන් වෙනුවෙනි. පාලකයන් වෙනුවෙන් නොවේ. මහින්ද වේවා මෛත්‍රී වේවා රනිල් වේවා එහි වෙනසක් නැත. වරද දුටු තැන අපි නිවට ලෙස හැකිලී නොසිට වරද පෙන්වා දෙන්නෙමු. වරද පිළිගන්නට කැමැත්තෝ පිළිගනිත්වා. වරද පිළිනොගන්නෝ අපට තර්ජනය කළද අපේ ගමන නවතින්නේ නැත.

අපට වචනයකින් හෝ දිරි දුන් ඔබ සැම පිළිබඳ මතකය අප හදවත් තුළ නිබඳ රැඳී තිබෙන බව ලියා තබන්නෙමු.

**සංස්කාරක**